**විශ්වවිද්‍යාලයීය වෘත්තීය සමිති ඒකාබද්ධ කමිටුව**

**University Trade Union joint Committee**


සම සභාපතිවරු

පී.එච්.ඩී.එස්. ප්‍රියන්ත
වෛද්‍ය පීඨය
රුහුණු විශ්වවිද්‍යාලය
071-4450507

එම්.ඩී. දාබරේරා
වෛද්‍ය පීඨය
කැළණිය විශ්වවිද්‍යාලය
071- 4464650

සම ලේකම්

ජනක විමලසූරිය
ශ්‍රී ජයවර්ධනපුර
විශ්වවිද්‍යාලය
071-6811263

පී.කේ. රුවන් කුමාර
පේරාදෙණිය
විශ්වවිද්‍යාලය
071 -4446753

භාණ්ඩාගාරික

ප්‍රියන්ත වීරසූරිය
පේරාදෙණිය
විශ්වවිද්‍යාලය
076-1735559

Joint Presidents

P.H.D.S. Priyantha
Faculty of Medical Science
University of Ruhuna
071-4450507

M.D. Dabarera
Faculty of Medical Science
University of Kelaniya
071-4464650

Joint Secretary

Janaka Wimalasuriya
University of Sri Jayewardenepura
071-6811263

P.K. Ruwan Kumara
University of Peradeniya
071-4446753

Treasure

Priyantha Weerasuriya
University of Peradeniya
077-9024612


2019-10-15

සභාපති
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින්

ලේකම්
නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින්

සභාපති
ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
කාමර අංක 02 - 116
බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව
බෞද්ධාලෝක මාවත
කොළඹ 07

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාල අධ්‍යයන, අනධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් 2016 රාජ්‍ය අයවැය අනුව කළමනාකරණ සේවා 4/2016 චක්‍රලේඛය නිකුත් කිරීම තුළ ඇති වී තිබෙන වැටුප් විෂමතාවය නිවැරදි කරවා ගැනීම.**

2016 අයවැය යෝජනා අනුව විශ්වවිද්‍යාල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වැටුප් විෂමතාවය නිරාකරණය කර ගැනීම සම්බන්ධව නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යතුමා අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශය සහ අමාත්‍ය මණ්ඩල කැබිනට් තීරණ දැනුම් දීමේදී එහි ලේකම්තුමා වන එස්. අබේසිංහ මහතාගේ අත්සනින් ලබා දී ඇති කැබිනට් තීරණ අංක 01 වශයෙන් යා කර ඇත.

එම අනුමත වූ කැබිනට් පත්‍රිකාවෙහි අඩංගු කරුණු සනාත කිරීමට පහත සඳහන් කරුණු ඉදිරිපත් කරමු.

1. i. වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලේකම් අනුර ජයවික්‍රම මහතා අධ්‍යක්ෂ ජනරාල් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද මාගේ අංක NSCC/01/GP/13-5 Vol II දරණ 2019.08.15 දිනැති අංක 03 හි 3.1 කෙරෙහි අවධානය යොමු කරමු.

"2016 අයවැය යෝජනා අනුව 2015.12.31 දිනට රාජ්‍ය සේවයේ පැවති වැටුප එදිනට අදාළව පැවති රු.10000.00 මාසික අන්තර් දීමනාව සහ වැටුපෙන් 15% ක් හා 5%ක් වූ විශේෂ දීමනාව ද ඇතුළත් කරමින් වැටුප් ව්‍යුහයන් සකස් කිරීමට භාණ්ඩාගාර ලේකම්ගේ **FP/06/100/05/01/2016** හා 2016.01.21 දිනැති ලිපිය මගින් එවකට පැවති ජාතික වැටුප් කොමිෂන් සභාවට පිටපතක් සහිතව රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත උපදෙස් ලබා දී තිබුණි. එසේම හැකිතාක් දුරට රාජ්‍ය සේවයේ එතෙක් පැවති වැටුප් අනුපාතය එලෙසම රඳවා ගැනීමට ද එම ලිපිය මගින් උපදෙස් ලබා දී තිබුණි"

ii. තවද එම ලේඛනයෙහිම නිර්දේශ යටතේ දක්වා ඇති 6.4 හි "රජය මගින් ප්‍රකාශිත ප්‍රතිපත්තියට අනුකූල වන සේ මෙම වැටුප් ව්‍යුහය සකස් කර ඇති බැවින් වෙනත් පදනමක් යොදා ගත යුතු යැයි අදහස් කරන්නේ නම් ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම යෝග්‍ය බව ද සඳහන් කරනු කැමැත්තෙමි" ලෙස සඳහන් වේ.

(ඉහත i හා ii ට අදාළ ඇමුණුම් ඇමුණුම් අංක 01 වශයෙන් මෙයට යා කර ඇත)

2. මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් **DMS/C/2/2018** දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 4/2016 (I) 2018.02.23 දාතමින් ලේකම්, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්ය මණ්ඩලය හා විශ්වවිද්‍යාල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල වැටුප් සංශෝධනය කිරීම යටතේ භාණ්ඩාගාරය හා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අත්සනින් නිකුත් කරනු ලබන චක්‍රලේඛය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිගේ අත්සනින් Commission Circular No. 17/2016 (V) මගින් 2018.06.01 නිකුත් කරන ලද චක්‍රලේඛය මගින් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයාගේ හා මහාචාර්යවරයාගේ (C-AC 5 – 2016) මූලික වැටුප 2015.12.31 දින මූලික වැටුප පදනම් කර ගනිමින් 2020.01.01 වන දිනට 107%කින් වැඩි කර ඇත. ඇමුණුම 02 වශයෙන් එම චක්‍රලේඛය මෙයට යා කර ඇත.

3. විශ්වවිද්‍යාල සේවය හා රාජ්‍ය සේවය අතර 2015.12.31 දින වන විට හා ඊට පෙර පැවති ආරම්භක මූලික වැටුපේ සාපේක්ෂ ප්‍රතිශතය 2020.01.01 දිනට හා ඉන් පසුවට නොවෙනස්ව පවත්වාගෙන යමින් විශ්වවිද්‍යාල සේවයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයන්හි ඇති

මේ තිබෙන වැටුප් විෂමතාවය නිවැරදි කිරීමට පහත සඳහන් කරුණු විමසා බැලීමේදී තහවුරු වනු ඇත.

2015.12.31 දිනට විශ්වවිද්‍යාල සේවය සහ රාජ්‍ය සේවයේ ආරම්භක මූලික වැටුප් තලයන් වන **PL 1** හි iii පහත සඳහන් පරිදි වේ.

විශ්වවිද්‍යාල සේවය - (2015-12-31 දිනට) =14150.00

රාජ්‍ය සේවය - (2015-12-31 දිනට) =11730.00

ඉහත වැටුප් තල 2015-12-31 දිනට 100% ප්‍රතිශතයක් ලෙස ගත් කළ පහත සඳහන් පරිදි වේ.

14150.00 - 11730.00 = **2420.00**

$$\frac{2420.00}{11730.00} \times 100 = \underline{\mathbf{20.63\%}}$$

ඒ අනුව ඉතා පැහැදිලිව 2015-12-31 දින වන විට රාජ්‍ය සේවයට වඩා විශ්වවිද්‍යාල සේවයේ ආරම්භක මූලික වැටුප් තලය 20.63% ක් ඉදිරියෙන් තිබෙන බව පෙනී යයි.

2020-01-01 දිනට විශ්වවිද්‍යාල සහ රාජ්‍ය සේවයේ ආරම්භක මූලික වැටුප් තල වන **PL 1** හි iii පහත සඳහන් පරිදි වේ.

විශ්වවිද්‍යාල සේවය - (2020-01-01 දිනට) =27025.00

රාජ්‍ය සේවය - (2020-01-01 දිනට) =24250.00

ඉහත වැටුප් තල 2020-01-01 දිනට 100% ප්‍රතිශතයක් ලෙස ගත් කළ පහත සඳහන් පරිදි වේ.

27025.00 - 24250.00 = **2775.00**

$$\frac{2775.00}{24250.00} \times 100 = \underline{\mathbf{11.44\%}}$$

ඒ අනුව ඉහත සැසඳීමට 2015-12-31 වන දිනට ආරම්භක මූලික වැටුප් තලවල පැවති 20.63% ක සාපේක්ෂ ප්‍රතිශතය 2020-01-01 දිනට ආරම්භක වැටුප් තලයන්හි සාපේක්ෂ ප්‍රතිශතය 11.44% දක්වා අඩු වී ඇත.

**ඒ අනුව 2015-12-31 දිනට සාපේක්ෂව 2020-01-01 දිනට රාජ්‍ය සේවය හා විශ්වවිද්‍යාල සේවය අතර සාපේක්ෂ අනුපාතය (20.63% - 11.44% - 9.19%) 9.19%කින් අඩු වී ඇති බව පැහැදිලි වේ. තවද එම 9.19% අතිකුත් වැටුප් තලයන්ට ලැබුණු විට සියලුම වැටුප් තල 107% සීමාවට ළඟා වනු ඇත.**

ඉහත අංක 1 හි i දක්වා ඇති පරිදි වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලේකම් අනුර ජයවික්‍රම මහතා අධ්‍යක්ෂ ජනරාල් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද ඔහුගේ අංක NSC/01/GP/B – 5 VolI දරණ 2019-08-15 දිනැති අංක 3 හි 3.1 **[illegible]** ලබා දී ඇති අමාත්‍ය මණ්ඩල කැබිනට් තීරණ මත 2015-12-31 දිනට රාජ්‍ය සේවය සහ විශ්වවිද්‍යාල අතර පැවති සාපේක්ෂ ප්‍රතිශතය ආරක්ෂා විය යුතු බැවින් 2015-12-31 දිනට විශ්වවිද්‍යාල ආරම්භක මූලික වැටුප 20.63% කින් ඉහළ නංවා 2020-01-01 දිනට 107% සීමාවට ගෙන එමට ඇවැසි පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

4. රාජ්‍ය සේවයට වඩා විශ්වවිද්‍යාල සේවයේ වැටුප් තලයන්හි සාපේක්ෂ ප්‍රතිශතය ඉහළ අගයක් පවත්වාගෙන යාමට, විශ්වවිද්‍යාල ආරම්භ කරන විට එහි ඇති ඉහළ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම රටකට අතිශයින් වැදගත් බැවින් මානව සම්පත දැනුමින් පරිපූර්ණ කිරීමේ ප්‍රධානතම ආයතනය විශ්වවිද්‍යාල වීම යන කරුණු සහ රාජ්‍ය සේවයට ඇති වරප්‍රසාද විශ්වවිද්‍යාල සේවයට නොමැති වීම තුළ රාජ්‍ය සේවයට වඩා වැඩි ආරම්භක වැටුපක් විශ්වවිද්‍යාල සේවයට ලබා දෙන ලදී.

- විශ්වවිද්‍යාල පද්ධතියට ඇති වී තිබෙන වැටුප් විෂමතාවය සමනය කිරීම සඳහා ඉහත සඳහන් ප්‍රධාන කරුණු අංක 01 සිට 04 සැලකිල්ලට ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.
- විශේෂයෙන් රාජ්‍ය සේවයත් විශ්වවිද්‍යාල සේවයත් අතර 2015-12-31 දිනට පැවති සාපේක්ෂ වැටුප් අනුපාතය ආරක්ෂා කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.
- තවද විශ්වවිද්‍යාල සේවයේ වැටුප් තල 2ක් පමණක් 2015-12-31 දිනට තිබී වැටුපට 2020-01-01 දින වන විට 107% සීමාවට ගෙන යාම තුළ අසාධාරණව ඇති වන වැටුප් විෂමතාවය තව තවත් ඉහළ ගොස් ඇත. විශ්වවිද්‍යාල සේවයට ඇති වී තිබෙන වැටුප් විෂමතාවය නිවැරදි කිරීමට වැටුප් තල දෙකකට පමණක් සීමා වී ඇති 107% සීමාවට අතිකුත් වැටුප් තල 19 ගෙන එන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

ඉහත කරුණු සියල්ල සැලකිල්ලට ගනිමින් අමාත්‍ය මණ්ඩල කැබිනට් තීරණ මත 2019-11-02 දිනට විශ්වවිද්‍යාල පද්ධතියේ පවතින වැටුප් විෂමතාවය නිවැරදි කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

ඔබතුමාගේ සභාපතිත්වයෙන් යුත් ජාතික වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාව මගින් විශ්වවිද්‍යාල සේවයේ වැටුප් ව්‍යුහ අගයන් පිළිබඳ තිබූ විෂමතාවය ඉවත් කිරීමට කරන ලද යෝජනාව වෙනුවෙන් ස්තූතිය පුද කරන අතර, ඔබතුමාගේ සභාපතිත්වයෙන් යුත් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව මගින් විශ්වවිද්‍යාල සේවයේ ආරම්භක වැටුප් තලයන්හි විෂමතාවය නිවැරදිකොට අනෙකුත් වැටුප් තලයන්ට නියමිත පරිදි ගලපා විෂමතාවය මඟහැර කිරීම වෙනුවෙන් සකස් කිරීමට නියමිත ලේඛන කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙර විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩල වෘත්තීය සමිති එකමුතුව සමග සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලබා දෙන මෙන් ඉල්ලා සිටිමු.

ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ඉදිරි සියලුම රාජකාරී කටයුතු සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවා! යි පතමු.

ස්තූතියි

මෙයට
ඒකාබද්ධ කමිටුවේ නියමය පරිදි

(පී.එච්.පී.එන්. ශ්‍රියන්ත/ එම්.ටී. ධම්මසිරි)
සම සභාපතිවරු

(ජනක විමලසූරිය/ පී.කේ. රුවන් කුමාර)
සමලේකම්වරු